**නෙළුව ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට නෙළුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) මිලදී ගත් හා පරිත්‍යාග වශයෙන් ලැබූ වත්කම්වල එකතු වටිනාකම රු.47,628,359 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේදී ගෙවා තිබූ කර්මාන්ත 04 කට අදාළ රු.343,399 ක වටිනාකම ණයහිමියන් යටතේ දක්වා තිබූ අතර, කර්මාන්ත 03 කට අදාළ ප්‍රාග්ධන ණයහිමි වටිනාකම රු.229,625 ක් වැඩියෙන් හා විවිධ ණයහිමියන් රු.204,029 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මුදල් ලැබී තිබූ කර්මාන්ත 02 ට අදාළ රු.879,942 ක වටිනාකම තවදුරටත් ප්‍රාග්ධන ණයගැතියන් යටතේ දක්වා තිබූ අතර, කර්මාන්ත 04 කට අදාළ ප්‍රාග්ධන ණයගැති වටිනාකම රු.165,525 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු එක්වන් මුදල රු.341,100 ක් අඩුවෙන් හා සතිපොළේ බදු මුදල් ආදායම රු.56,826 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ස්ථාවර වත්කම් ගිණුම සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම අතර රු.517,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.7,097,824 ක විශ්‍රාම වැටුප් දායක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 63,171,769 ක් වූ ගිණුම් විෂයයන් 10 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.2,892,979 ක අසමානතා නිරීක්ෂණය විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම**

වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.72,839 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) ලැබිය යුතු ගිණුම්**

(i) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත වෙනුවෙන් ලැබිය යුතු එකතුව රු.8,202,379 ක් වූ ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක සිට පැවත එන එකතුව රු.3,572,193 ක් වූ ශේෂ 07 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2008 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින සතිපොළ තාවකාලික හා ස්ථිර කඩ කාමර සඳහා රු.547,800 ක හිඟ එක්වන් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ අවසානයට ගෙවිය යුතු එකතුව රු.6,970,622 ක් වූ ණයහිමි ශේෂය තුළ අවුරුදු 03 ක කාලයක සිට පැවත එන එකතුව රු.3,183,162 ක් වූ ශේෂ 03 ක් නිරවුල් කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.1,600,707 ක්වූ ගිණුම් විෂයයන් 09 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.6 අනුකූල නොවීම්**

-------------------

**1.3.6.1 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්**

-----------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 145 | ආපසු ගෙවිය යුතු තැන්පත් පිළිබඳ විස්තරාත්මක ප්‍රකාශයක් සකස් කර ලෙජරයේ දැක්වෙන ශේෂය හා ගැලපීම් කර නොතිබුණි. |
| (ii) රීති 164 | සභාවේ ගිණුම් ලියවිලි ලේකම්වරයා බලය පවරන ලද නිලධාරියෙකු විසින් හෝ ඔහු විසින් දිනපතා පරීක්ෂා කර, එහි අන්තර්ගත සටහන් නිවැරදි බවට සහතික කර නොතිබුණි. |
| (iii) රීති 217 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කර වාර්තා කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ.103, 104 | නැතිවීම් හා හානිවීම් පිළිබඳ කටයුතු කර, එම වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර, හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ii) මු.රෙ. 373 | 2004 වසරේ ලබාගෙන තිබූ රු.62,125 ක් වූ නොපියවූ අත්තිකාරම් ශේෂයක් පැවතුණි. |
| (ඇ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | නිෂ්ක්‍රීයව පැවති අත්ට්‍රැක්ටරය සහ පුද්ගලයින් ඔසවන යන්ත්‍රය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/ 2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | සභාව සතු වාහන 13 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.134,952 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,620,948 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

ජංගම ගිණුමට අදාළව මුදල් පොතේ ශේෂය හා ජංගම ගිණුමේ ශේෂය අතර රු.40,833 ක හඳුනා නොගත් වෙනසක් පැවතුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තු ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තු ගත ආදායම | 2016 බිල්කළ ආදායම | 2016 රැස්කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 430,000 | 288,080 | 324,845 | 42,005 | 430,000 | 429,840 | 415,442 | 78,770 |
| කුලී | 6,154,800 | 4,036,189 | 4,074,856 | 202,418 | 6,218,750 | 5,956,293 | 5,947,604 | 241,085 |
| බලපත්‍ර ගාස්තු | 125,000 | 189,444 | 193,449 | 40,295 | 145,000 | 76,457 | 74,007 | 44,300 |
| වෙනත් ආදායම් | 5,508,000 | 3,903,940 | 5,400,513 | 3,976,978 | 5,625,500 | 4,201,701 | 1,289,067 | 5,473,551 |
| එකතුව | 12,217,800 | 8,417,653 | 9,993,663 | 4,261,696 | 12,419,250 | 10,664,291 | 7,726,120 | 5,837,706 |

#### 3.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත මුළු ආදායම රු.12,217,800 ක් වූ අතර බිල් කල ආදායම රු.8,417,653 ක් විය. රු.5,837,706 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුළු මුදල රු.14,255,359 ක් වුවද, වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු.9,993,663 ක් වීමෙන් වර්ෂය අවසානයට මුළු හිඟය රු.4,261,696 ක් වී තිබුණි.

**2.3.3 වරිපනම් හා බදු**

**-------------------**

**අක්කර බදු**

**-----------**

ආරම්භක හිඟය රු.21,370 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.5,130 ක් සමඟ රු.26,500ක් අයවිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ මුළු අයවීම් රු.3,160 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.23,340 ක් හිඟව පැවතුණි.

**2.3.4 කඩ කුලී**

----------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ආරම්භක හිඟය රු.241,085 ක් වූ අතර, රු.4,036,189 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.4,277,274 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.4,074,856 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.202,418 ක හිඟ ශේෂයක් පැවතුණි.

(ආ) 2017 වර්ෂයේ සිදු කල නව තක්සේරුව අනුව කුලී අය නොකිරීම නිසා රු.1,054,956 ක පාඩුවක් සිදුවී තිබුණි.

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**-----------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.3,500,000 ක් හා උසාවි දඩ රු.304,231 ක් විය.

**03. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්ය සාධන ඇගයීම**

-----------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

**-----------------------------------------------**

2016 ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීම වැඩසටහන යටතේ කර්මාන්ත 04 ක් ඉටුකිරීම සඳහා රු.1,348,163 ක් අනුමත කර තිබුණ ද, රු.1,000,000 ක අත්තිකාරම් මුදලකින් රු.252,784 ක මුදලක් පමණක් වැයකර එක් කර්මාන්තයක් පමණක් ඉටුකර තිබුණි.

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

**------------------------------**

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති දපපා/පපාකො/2010/1 දරන චක්‍රලේඛයේ 4 වන වගන්තිය ප්‍රකාරව සභාව විසින් බදු දුන් සියළු කඩ කාමර සඳහා මාසික බදු මුදල මෙන් වාරික 100 ක් වටිනා එක්වන් මුදල් අයකරගත යුතු වුවද අයකර තිබුනේ මාස 03 ක කඩ කුලිය පමණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

සේවක සංඛ්‍යා සැළැස්මේ අනුමත තනතුරුවල පුරප්පාඩු 11 ක් හා 04 ක් වූ අතිරික්තයක් විය.

## 3.4 වත්කම් කළමණාකරණය

### 3.4.1 නිෂ්ක්‍රීය/ඌණ උපයෝජිත වත්කම්

භාවිතයට ගත හැකිව තිබූ ට්‍රැක්ටරයක් වසරක කාලයක සිට, යතුරු පැදියක් වසර 02 ක කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනය

දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2009 ජුනි 04 දිනැති අංක නිප්‍රලේ/ඉංසේ/චක්‍රලේඛ දරන ලිපියේ 4 වන ඡේදය ප්‍රකාරව ගමින් ගමට දොරින් දොරට වැඩ සටහන යටතේ වටිනාකම රු.1,234,654 ක් වූ දෙල්ලව ඇඳවල පටු පාලම ඉදිකිරීම වෙනුවෙන් සකස් කරන ලද ඇස්තමේන්තු, දිස්ත්‍රික් ඉංජිනේරු (පළාත් පාලන) ගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ඉටුකර තිබූ අතර, මෙහි නිමි වැඩ වටිනාකම රු.1,160,577 ක් විය.

# 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) වියදම් විෂයයන් 08 ක එකතුව රු.8,101,781 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, එම වටිනාකම සියයට 15 සිට සියයට 100 අතර පරාසයක පැවතුණි.

(ආ) ආදායම් විෂයයන් 06 ක ළඟාකර නොගත් ඉලක්කවල එකතුව රු.8,539,956 ක් වූ අතර, එම වටිනාකම සියයට 02 සිට සියයට 51 දක්වා පරාසයක විය.

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් රැස්වීම් පවත්වා නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනය පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 යන රෙගුලාසිවල දැක්වෙන සහ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණයවූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් - | (i) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා ඒවායේ වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබීම. |
| | | (ii) | සභාව සතු ප්‍රජාශාලා, සුසානභූමි සහ පොදු ස්ථාන පිළිබඳ තොරතුරු ඇතුළත් කර ලේඛනයක් පවත්වා නොතිබීම. |
| | | (iii) | හානි හා පාඩු පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබීම. |
| (ආ) | සේවක මණ්ඩල කළමනාකරණය - | | පුරප්පාඩු තනතුරු හා අතිරික්ත සේවකයන් පිළිබඳ කටයුතු නොකිරීම. |
| (ඇ) | ආදායම් රැස්කිරීම - | | හිඟ ආදායම් අයකර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක නොකිරීම. |
| (ඈ) | ගිණුම්කරණය හා ලේඛණ පැවැත්වීම - | (i) | ඉකුත් වර්ෂවල සිට එන ශේෂ පිළිබඳව සොයා බලා ගිණුම් නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| | | (ii) | සමාලෝචිත වර්ෂයේදී අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට පියවර නොගැනීම. |

(ඉ) කළමනාකරණ අකාර්යක්ෂමතා - (i) කසළ කළමනාකරණය විධිමත් නොකිරීම.

(ii) වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබීම.

(ඊ) අයවැය පාලනය - (i) වාර්ෂික අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන වෙන් කරවාගෙන ඇති සියළු වියදම් විෂයයන්හි ඉතිරිවීම් පැවතීම.

(ii) ආදායම් විෂයයන් 06 ක අයවැය ලේඛනයේ දක්වා තිබූ ආදායම් ඉලක්ක ළඟා කර ගෙන නොතිබීම.

(iii) වියදම් සහ ආදායම් පිළිබඳ පසු විපරම් කර අයවැය සංශෝධනය කර ගැනීමට කටයුතු නොකිරීම.